**කළමනාකරණ සේවා නිලධාරි සේවයේ III ශ්‍රේණියට බඳවාගැනීමේ සීමිත තරග විභාගය**

**2019(2021)**

උක්ත තරග විභාගය සමත් කුසලතා අනුපිළිවෙල අනුව පත්වීම් ලැබීමට සුදුසුකම් ලබා ඇති අයදුම්කරුවන් 2023.01.17 දින සිට ක්‍රියාත්මක වන පරිදි කළමනාකරණ සේවා නිලධාරි සේවයේ III ශ්‍රේණියට පත් කිරීමට නියමිත ය.

02. ඒ අනුව, සම්මුඛ පරීක්ෂණයට පැමිණි අයදුම්කරුවන් පහත සඳහන් සබැඳිය භාවිතා කර වට්ස්ඇප් (Whatsapp) සමූහයට එක් වී එහි දක්වා ඇති උපදෙස් අනුගමනය කිරීම මගින් මෙම අමාත්‍යාංශය යටතේ පවත්වාගෙන යන MISCO මෘදුකාංගයට ප්‍රවේශ වීමෙන් තමා අනුයුක්ත කර ඇති සේවා ස්ථානය දැන ගත හැකි වේ.

https://chat.whatsapp.com/E8CMgaxAlUYIS6i8n9KaQv

03. ඉහත වට්ස්ඇප් (whatsapp) සමූහයට එක් කර ඇත්තේ මෙම සම්මුඛ පරීක්ෂණයට සහභාගී වීමේ දී මාර්ගගත දත්ත පත්‍රිකාවට ඇතුළත් කරන ලද දුරකථන අංකය වේ.

04. සම්මුඛ පරීක්ෂණයේ දී සුදුසුකම් නොලැබූ හා යම් යම් කරුණු මත පත්වීම් ලබා නොදී රඳවා ගත් (Pending) අයදුම්කරුවන්ගේ නම් ඉහත සඳහන් පද්ධතියට ඇතුළත් කර නැත.

05. තම සේවා ස්ථානය දැන ගැනීමෙන් පසු නිලධාරීන් 2023.01.17 දින පෙ.ව. 8.30ට අදාළ සේවා ස්ථානය වෙත වාර්තා කළ යුතු වේ. එහිදී අනන්‍යතාවය තහවුරු කර ගැනීමෙන් සහ පත්වීම් ලිපියේ සඳහන් කොන්දේසි පිළිබඳව දැනුවත් කිරීමෙන් පසු පත්වීම ලබා ගැනීමට එකග වන්නේ නම් පමණක් එක් එක් නිලධාරියා වෙත පත්වීම් ලිපිය (නිලධාරියාගේ පිටපත) ලබා දෙන ලෙස මේ වන විටත් ආයතන ප්‍රධානියා දැනුවත් කර ඇත.

06. නිලධාරීන් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල ප්‍රධාන කාර්යාල වෙත අනුයුක්ත කර ඇති අතර, ඒ යටතේ පවත්නා උප කාර්යාලවලට අනුයුක්ත කිරීම සම්බන්ධයෙන් තීරණය අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් ගනු ඇත.

07. රාජ්‍ය සේවයේ අත්‍යවශ්‍ය පුරප්පාඩු ප්‍රමාණයක් පුරවා ගැනීම සඳහා සිදු කෙරෙන බඳවා ගැනීමක් වන බැවින් සියලුම නිලධාරීන් අනුයුක්ත කරන ලද සේවා ස්ථානයේ ම සේවය කිරීමට කටයුතු කළ යුතු අතර, පත් කරනු ලබන සේවා ස්ථානයේ විධිමත්ව රාජකාරි භාර ගැනීමෙන් අනතුරුව දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් සිදු කරනු ලබන ඉල්ලීම් හැර වෙනත් කවර ආකාරයකින් හෝ සිදු කරනු ලබන කිසිදු අභියාචනයක් සලකා නොලබන බව වැඩිදුරටත් දන්වා සිටිමි.

08. මෙම බඳවාගැනීම සම්බන්ධයෙන් මැතිවරණ කොමිෂන් සභාවේ එකඟතාව ලබාගෙන ඇති බව ද සැලකුව මැනවි.

එස්. ආලෝකබණ්ඩාර

ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්

## <u>முகாமைத்துவ சேவை உத்தியோகத்தர் சேவையின் தரம் III இற்கு ஆட்சேர்ப்பதற்கான மட்டுப்படுத்தப்பட்ட போட்டிப் பரீட்சை 2019(2021)</u>

மேற்படி பரீட்சையில் சித்தியடைந்த திறமை ஒழுங்கின் படி நியமனம் வழங்குவதற்குத் தகைமை பெற்ற உத்தியோகத்தர்கள் 2023.01.17 ஆம் திகதி முதல் நடைமுறைக்கு வரும் வகையில் முகாமைத்துவ சேவை உத்தியோகத்தர் சேவையின் தரம் *III* இற்கு நியமிக்கப்படவுள்ளனர்.

02. அதற்கிணங்க, நேர்முகப் பரீட்சைக்குக்கு முகங்கொடுத்த விண்ணப்பதாரர்கள் கீழ்க்குறிப்பிட்ட இணைப்பைப் பயன்படுத்தி வட்ஸப் *(Whatsapp)* குழுவுக்குள் இணைந்து அதில் குறிப்பிடப்பட்டிருக்கும் அறிவுறுத்தல்களைப் பின்பற்றுவதன்மூலம் இந்த அமைச்சின் கீழ் இயக்கப்படும் *MISCO* மென்பொருளில் பிரவேசித்து தாம் சேவையில் இணைக்கப்பட்டுள்ள சேவை நிலையத்தை அறிந்துகொள்ள முடியும்.

https://chat.whatsapp.com/E8CMgaxAlUYIS6i8n9KaQv

03. மேற்குறிப்பிட்ட வட்ஸப் *(Whatsapp)* குழுவுக்கு நேர்முகப்பரீட்சைக்கு கலந்துகொள்ளும் போது நிகழ்நிலைத் தரவுப் படிவத்தில் வழங்கிய தொலைபேசி இலக்கம் மட்டுமே சேர்த்துக்கொள்ளப்படும்.

04. இந்த நேர்முகப் பரீட்சையில் தகுதிபெறாத மற்றும் ஏதேனும் விடயங்களின் காரணமாக நியமனம் வழங்கப்படாது நிலுவையில் வைக்கப்பட்டுள்ள (Pending) விண்ணப்பதாரர்களின் பெயர்கள் மேற்குறித்த முறைமையில் சேர்க்கப்படவில்லை.

05. தமது சேவை நிலையத்தை அறிந்துகொண்டதன் பின்னர் உத்தியோகத்தர்கள் 2023.01.17 ஆம் திகதி மு.ப. *8.30* மணிக்கு சேவை நிலையத்திற்குச் சமுகமளித்தல் வேண்டும். அதன் போது ஆளடையாளத்தை உறுதிப்படுத்தி நியமனக் கடிதத்தில் குறிப்பிடப்பட்டுள்ள நிபந்தனைகளைப் பற்றி அறிந்து கொண்டதன் பின்னர் நியமனக் கடிதத்தைப் பெற்றுக்கொள்ள உடன்படுவதாயின் மாத்திரம் ஒவ்வொரு உத்தியோகத்தருக்கும் நியமனக் கடிதத்தை (உத்தியோகத்தரின் பிரதியை) வழங்குமாறு நிறுவனத் தலைவர்களுக்கு ஏற்கனவே அறிவிக்கப்பட்டுள்ளது.

06. உத்தியோகத்தர்கள் அமைச்சுக்களினதும் திணைக்களங்களினதும் தலைமையகங்களில் சேவையில் இணைக்கப்பட்டுள்ள அதேவேளை அதன் கீழ் உள்ள உப அலுவலகங்களில் சேவையில் இணைப்பது தொடர்பான தீர்மானம் திணைக்களத் தலைவர்களினால் எடுக்கப்படும்.

07. அரசாங்க சேவைக்கு அத்தியவசியமான ஒரு தொகை வெற்றிடங்களை நிரப்புவதற்காக ஒரு ஆட்சேர்ப்பு என்பதனால், அனைத்து உத்தியோகத்தர்களும் சேவையில் இணைக்கப்படும் சேவை நிலையத்திலேயே பணிபுரிய வேண்டும் என்பதுடன் நியமிக்கப்படும் சேவை நிலையத்தில் முறையாக கடமைகளைப் பொறுப்பேற்ற பின்னர் திணைக்களத் தலைவர் ஊடாக செய்யப்படும் கோரிக்கைகளைத் தவிர வேறு விதங்களில் செய்யப்படும் எந்தவொரு மேன்முறையீடும் கவனத்தில் எடுக்கப்படமாட்டாது என்பதையும் அறியத் தருகின்றேன்.

08. இவ் ஆட்சேர்ப்பு தொடர்பில் தேர்தல்கள் ஆணைக்குழுவின் அனுமதி பெற்றுக்கொள்ளப்பட்டுள்ளது என்பதனையும் கவனத்தில் கொள்ளவும்.

ஒப்பம்/. எஸ். ஆலோகபண்டார
இணைந்த சேவை பணிப்பாளர் நாயகம்